**කටුගන්නාව නගර සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 20 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කටුගන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී සිංහ සමාජය විසින් ඉදිකළ රු.7,000,000 ක් වටිනා නිවාස 08 ක් පරිත්‍යාග ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ii) | සභාව සතු කටුගන්නාව පොළ හා රජයේ නිවාස 7 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (iii) | ණයහිමියෝ රු.858,000 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | සභාවට අයිති වගකීම් හඳුනාගෙන 2020 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ හා මුද්දර ගාස්තු උපචිත පදනමට ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව උපචිත පදනමට ගිණුම්ගත කළ යුතු වේ. | වර්ෂයට අදාළ ලැබූ උපලේඛන පදනම්ව ගිණුම්ගත කර ඇත. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගෙවිය යුතු ගිණුම් ශේෂ 6 ක එකතු වටිනාකම රු.16,297,777 ක් වූ අතර, එයින් වසර 1-3 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.4,955,038 ක් හා වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂය රු.624,450 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | සමහර ශේෂ ගෙවා ඇත. සභාවේ මූල්‍ය තත්ත්වය මත කොටස් වශයෙන් ගෙවන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | රු.928,546 ක් වටිනා කල් ඉකුත් වූ තැන්පතු 59 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2016 – 2017 ට අදාළ ශේෂ රු.468,603 ක් වන අතර, ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2010 නොවැම්බර් 24 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 5/2010 චක්‍රලේඛය | අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ නොවූ අයෙකු සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් බඳවාගෙන රු.49,500 ක් වැටුප් ගෙවා තිබුණි. | පත්වීම් ලබාදීම චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කළ යුතු වේ. | අධ්‍යාපන සුදුසුකම් සනාථ කරගෙන පත්වීම් ලබාදුන් බව කාරුණිකව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.458,299 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,175,888 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,655,000 | 7,700,593 | 4,517,460 | 4,957,474 | 7,650,000 | 7,655,135 | 8,171,375 | 5,357,337 |
| (ii) | කුලී | 3,611,500 | 3,586,600 | 3,127,941 | 821,954 | 3,032,300 | 2,114,985 | 1,952,635 | 674,918 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,535,000 | 1,540,976 | 1,532,476 | 36,000 | 1,300,000 | 1,314,386 | 1,314,386 | - |
| (iv) | වෙනත් ආදායම් | 7,450,000 | 3,556,111 | 370,511 | 5,666,022 | 2,585,000 | 2,798,655 | 2,232,409 | 1,015,961 |
| | | 20,251,500 | 16,384,280 | 9,548,388 | 11,481,450 | 14,567,300 | 13,883,161 | 13,670,805 | 7,048,216 |

### 2.2.2 කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රු.749,127 ක හිඟ කඩ කුලී ශේෂයක් පැවති අතර ඉන් දීර්ඝකාලීනව පැවත එන කඩ 17 ක හිඟ ශේෂය රු.290,469 ක් හා පැරණි වෙළඳ සංකීර්ණයේ පැවති කඩ කාමර 4 ක 2007 හා 2013 වර්ෂවල සිට පවතින රු.151,369 ක හිඟ ශේෂයක් විය. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුද්‍රා තැබීමට කටයුතු කළද හදිසියේ ඇතිවූ COVID 19 වසංගතය හේතුවෙන් එය කර ගැනීමට නොහැකි වූ බව දන්වමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙළින් රු.161,832 ක් හා රු.904,200 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් සභාවෙන් ඉල්ලුම් කර ඇති බව දන්වා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 14 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභාවේ කසළ බැහැර කිරීමට නිසි ස්ථානයක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් ඉදිරියේදී කසළ බැහැර කිරීම සභාවට ගැටළුකාරී තත්ත්වයක් ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය. | විධිමත්ව කසළ කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම් කොමිසමට අයිති ඉඩමක් හඳුනාගෙන අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ප්‍රමාණවත් අයුරින් හඳුනාගෙන නොමැති අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ද ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන ඉලක්ක සැලසුම් කර ව්‍යාපෘති හඳුනාගෙන අදියර කීපයකින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව දන්වමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක් 2011 වර්ෂයේ සිට වසා දමා තිබීම හේතුවෙන් රු.1,362,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | ආදායම් ඉපදවීම සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වේ. | කඩ කාමරය ස්ථාන ගතකොට තිබෙන ස්වභාව අනුව කිසිදු ගැනුම්කරුවකු මෙම කඩ කාමරය ගැනීමට ඉදිරිපත් වී නොමැත. |
| (ආ) | සභාව සතු ඉඩම් කට්ටි 37 ක් තක්සේරු වාර්තා ලබා නොගෙන සභා තීරණ මත වාර්ෂිකව බදු දී තිබුණි. | තක්සේරු කර බදු දීමට කටයුතු කළ යුතු වේ. | ආදායම් පරීක්ෂකවරුන්ගේ තක්සේරුව මත වාර්ෂිකව බදු ලබාදෙන බව දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුරු 07 ක පුරප්පාඩු 12 පැවතුණි. | පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කළ යුතු වේ. | වර්තමානයේ රජයේ නීති අනුව බඳවා ගැනීම් අත්හිටුවා ඇත. නීති ඉවත්කළ වහාම බඳවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වර්ෂයේ වරිපනම් තක්සේරුව අනුව 2019 වර්ෂය දක්වා වරිපනම් අයකර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවට ලිඛිතව දන්වා තක්සේරු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2017 වර්ෂයේ ඉල්ලුම් කළද තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මෙම කාර්යය ඉටුවී නොමැති බව දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කඩුගන්නාව පොදු වැසිකිළි සංකීර්ණය අලුත්වැඩියාව සඳහා රු.1,020,000 ක වියදමක් දරා ඇතත්, පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරාගෙන ඉදිකිරීම් සිදුකළ යුතු වේ. | සභාව සතු වත්කමක් නොවන අතර, එය නඩත්තු කිරීම පමණක් සභාව සිදුකරනු ලබයි. |

### 3.5.2 නඩත්තු හා අලුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නව වෙළඳ සංකීර්ණය නවීකරණය සිදුකර බදුකරුවන්ට හා පාරිභෝගිකයන්ට පහසුකම් සැපයීමට කටයුතු කර නොතිබුණි. | පාරිභෝගික ආකර්ෂණය ඇතිවන ලෙස වෙළඳ සංකීර්ණ පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නඩත්තුව ඵලදායී නොවන නිසා නව සැලැස්මකට ඉදිකළ යුතු බව මහා සභාව තීරණය කර ඇත. |

### 3.5.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු රු.7,967,144 ක් පිරිවැය වූ වයිබ්‍රේටින් රෝල හා රු.1,400,000 ක් වටිනා මෝටර් රථය භාවිතයෙන් තොරව ගාල් කර තිබුණි. | වත්කම් උපරිම ලෙස උපයෝජනය කළ යුතු වේ. | මෙම වත්කම ඌන උපයෝජිත වත්කමක් බව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති අතර, සභාවට වාහන නොමැති නිසා 302-1522 කාර් රථය අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගන්නා බව දන්වමි. |

### 3.6 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ටෙන්ඩර් ලබා නොදෙන එළු මස් හා ගව මස් කඩ සඳහාද ප්‍රසම්පාදන දැන්වීම් පලකිරීම හේතුවෙන් එම දැන්වීම නිවැරදි කිරීම සඳහා නැවත ප්‍රසම්පාදන දැන්වීම පළකර, ඒ සඳහා රු.30,590 ක වියදමක් දරා තිබුණි. | ටෙන්ඩර් ලබාදෙන දේපළ සඳහා පමණක් දැන්වීම් පළ කළ යුතු වේ. | ප්‍රසිද්ධ පුවත්පත්වල කඩ කාමර බදුදීම සඳහා දැන්වීම් නිකුත් කළ අතර, ප්‍රදේශවාසීන් හා පූජ්‍ය පක්ෂයෙන් විශාල විරෝධතා ඇති වීම නිසා දැන්වීම සංශෝධනය කරන ලද බව දන්වමි. |